චක්‍ර ලේඛ අංකය: 3/2015


මගේ අංකය / எனது இல. / My No. – මගේ අංකය. RG/MBD/1/2012

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. – 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. – 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – info@rgd.gov.lk, rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாயகத் திணைக்களம்

REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය

தலைமை அலுவலகம்

HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site – www.rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. – 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.


දිනය / திகதி / Date: 2015/05/22

සියළුම විවාහ, උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

## විවාහ, උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන්

## ජනමාධ්‍යයේ පෙනී සිටීම සහ මාධ්‍ය ප්‍රකාශ නිකුත් කිරීම

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන විවාහ, උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන් තම රාජකාරි ස්වරූපයෙන්ම ජන මාධ්‍යයේ රහපෑම් කටයුතු සඳහා දායක වන බව මා වෙත නිරීක්ෂණය වී ඇත. තවද, තම රාජකාරී කටයුතු සම්බන්ධයෙන් ජනමාධ්‍යයට තොරතුරු සපයන අවස්ථාද වාර්තා වී ඇත.

02. රෙජිස්ට්‍රාර් තනතුර රාජකාරිමය වශයෙන් ගත් කළ, රජයේ සේවයක් හැටියට සැලකෙන බැවින්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අවසරයකින් තොරව රාජකාරිමය ස්වභාවයෙන් රජයේ ලේඛනද සමග විද්‍යුත් මාධ්‍යයේ රහපෑම් කටයුතුවල නිරත වීම මෙන්ම, ජනමාධ්‍යයට තම රාජකාරියට අදාල තොරතුරු සැපයීමද විනය විරෝධී ක්‍රියාවකි. රජය හෝ රජයේ ආයතනයක් හෝ විවේචනය කිරීමේ නැතහොත් ස්වකීය ආයතනයේ දුක්ගැනවිලි ප්‍රකාශයට පත් කිරීමේ හෝ මාධ්‍යයක් වශයෙන් ජනමාධ්‍ය යොදා ගැනීමද වරදකි.

03. ඒ අනුව දෙපාර්තමේන්තුවේ සේවය කරන කිසිදු රෙජිස්ට්‍රාර්වරයකු මින් ඉදිරියට තම රාජකාරිමය ස්වභාවයෙන් ජනමාධ්‍ය ඉදිරියේ පෙනී නොසිටිය යුතුය. තවද තම රාජකාරී සම්බන්ධයෙන්, නිසි අවසරයකින් තොරව ජනමාධ්‍යයට අදහස් දැක්වීම හෝ තොරතුරු සැපයීමද සිදුනොකල යුතුය.

04. මෙම චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කරමින් කටයුතු කිරීම් මා වෙත වාර්තා වුවොත්, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරන බවද දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඉ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්

1. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ.ගැ.ස.
2. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - තම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සිටින සියළුම ග්‍රාමීය රෙජිස්ට්‍රාර්වරුන්ට චක්‍රලේඛ පිටපත බැගින් නිකුත් කිරීමට සහ දැ.ගැ.ස.